# වාණිජමය මට්ටමින් වම්බටු වගා කිරීම

කෘෂිකාර්මික රටක් වන ශ්‍රී ලංකාවෙ පිහිටීම, භූ විශමතාවය, දේශගුණය සහ පස ආදිය පදනම් කර ගෙන එක් එක් වගාවන්ට විශේෂ වූ ප්‍රදේශ වෙන් වෙන් වශයෙන් දැකිය හැකිය. මෑතදී අප සංචාරය කරන ලද රාජාංගන ජනපදය මෙවැනි එක් ප්‍රදේශයකි මහ වැලි ජලයෙන් පෝෂණය වන මෙම ජනපදයේ ගොවීන් මූලික වශයෙන් යොමු වී තිබුණේ ඔවුන්ගේ සම්ප්‍රදායික වගාවන් වන වී ඇතුළු අතුරු ආහාර භෝග වගාවන් කෙරෙහිය. එහෙත් මෑත කාලීන වශයෙන් උස්සාන වාරි මාර්ග ක්‍රමය යටතේ ගොවීන් ආර්ථිකමය වශයෙන් වැඩි පලදාවයක් ලබා ඇති වගාවන් කෙරෙහි නැඹුරු වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් විශාල ආදයමක් ලැබිය හැකි වගාවන් වන මිරිස් වගාව කෙරේ පළමුවෙන් යොමු වන ලදී. මිරිස් වගාවෙන් ලැබෙන ආදයම ඉහළ මට්ටමක පැවතුනත් වගා කටයුතු කර ගෙන යාමේ දී ඇති වන විවිධ දුෂ්කරතාවන් මෙන් ම විවිධ අලෙවි කරණ ගැටළු හේතු කොට ගෙන මිරිස් වගාවට සාපේක්ෂ ව පහසු වෙන් වැඩි ආදයම ලබා ගත හැකි වගාවක් වශයෙන් වම්බටු වගාව කෙරේ ගොවීන් යොමු වී ඇත.

වම්බටු වගාව මෙම ප්‍රදේශයේ විශාල ලෙස ආරම්භ කර වසර ගණනාවකි. මෙම වගාව සඳහා ගොවීන් නැඹුරු වීමට විශේෂ හේතුවක් තිබුනි. එනම් කළකට පෙර මෙම ගොවි ජන පදයේ එක්තරා පෞද්ගලික සංවිධානයයක් මගින් බටු වගා ව්‍යාපාරයක් ආරම්භ කර ඇත.

මෙම සංවිධානය විසින් ආරම්භ කරන ලද බටු වගාව ඉතාමත් සාර්ථක වූ අතර ප්‍රදේශයේ ගොවීන් එහි සේවය කර මුදල් ලබා ගෙන ඇත. මේ කාලය තුල බටු වගා ක්‍රම, එහි සාර්ථකත්වය සහ ලැබිය හැකි ආදයම ආදීය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගත් ගොවීන් බටු වතු වලට වැඩට යනවා වෙනුවට තම තමාගේ ගෙවතුවල බටු වගාව ක්‍රමයෙන් ආරම්භ කරන්නට විය. මේ ආකාරයට රාජාංගන ප්‍රදේශයේ වම්බටු වගාව ආරම්භ වූ බව ගොවීන්ගෙන් දැන ගත හැකි විය.

දැනට වසර 4 ක පමන කාල සීමාවක සිට එවකට අතුරු බෝග හා මිරිස් වගාව සඳහා යොදගෙන තිබූ ඉඩම් බටු වගාවෙන් වැසීගෙන යන තත්ත්වයක් ඇති විය. මෙයට විශේෂ හේතුව බටු වගාවේ අධික පලදාවක් ලැබීම හා සිත් ඇද ගන්නා සුළු ආදයමයි. බටු වගාව සඳහා යන පිරිවැයද ඉතාමත් අඩු බව ගොවීන්ගෙන් දැන ගත හැකි විය. මෙහිදී ගොවීන් විසින් අනුගමනය කරනු ලබන වගා ක්‍රමයන් ද වැදගත් වෙයි.

බටු වගාවේ අස්වනු ලැබීමට සාමාන්‍යයෙන් මාස 3 ක් පමණ ගත වේ. බටු වගාව සඳහා බිම් සකස් කර බටු පැල අඩි 3×4 පරතරයකට සිටුවනු ලබන අතර ඒ සමගම බටු පැල අතර බූෂිටා බීජද සිටුවනු ලබයි. එමෙන් ම බටු වගා බිම් වල සකස් කර ඇති නියර වල බණ්ඩක්කා බීජ සිටුවනු ලබයි. මෙසේ බටු වගාව බහු වගාවන් ලෙස කරනු ලබන අතර බටු පැලය වැඩෙන අවධියේ බණ්ඩක්කා හා බූෂිටා පැල වලින් බටු පැලයට සෙවන ලබා දෙයි. බූෂිටා හා බණ්ඩක්කා දින 45ක් පමණ සුළු කාලයක දී අස්වනු ලබා දෙන අතර මෙසේ කෙටි කාලකින් පලදාව ලබා ගත් මෙම වගාවන් ඉවත් කර වරක් පොහොර දැමීමෙන් සති 2කට පමණ පසු බටු අස්වනු ලැබීම ආරම්භ වෙයි. මෙම ක්‍රියාවලියේදී ගොවීන් විසින් වාසි කිහිපයක් අත් කර ගන්නා බව ගොවීන්ගේ අත්දැකීම් අනුව දැන ගත හැකි විය. එනම් බටු වගාවට එතෙක් ගිය පිරිවැය සම්පූර්ණයෙන් ම වාගේ බූෂිටා හා බණ්ඩක්කා වලින් ලබා ගත හැකි අතර ඊට අමතරව ලාභයක් ද ලැබිය හැකි අවස්ථා ඇත. ඒ අතරම බූෂිටා රනිල භෝගයක් නිසා පසේ සාරවත් භාවය වැඩිවන අතර එයින්ද බටු වගාවට රුකුලක් ලබා දෙයි. මෙම කරුණු අනුව ගොවීන්ගේ අත්දැකීම් මත බටු වලින් ලබන පළමු වන අස්වැන්න සිට ඔවුන් ශුද්ධ ලාභයක් ලබන බව කියති.

**ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි**

**එස්. එම්. සේනානායක**

**විසිනි.**

අක්කරයක බිම් ප්‍රදේශයක බටුපැල 2000ත් 2200ත් අතර ප්‍රමාණයක් සිටුවනු ලබන අතර පොහොර යෙදීම මාසයකට වරක් කළ යුතුයි. කෘමි නාශක දින 15 කට වරක් යොදවති. කම්කරුවන් යෙදවීමේ දී කුලිය වශයෙන් පිරිමි කම්කරුවන්ට රු. 35 ක්ද, ගැහැණු අයෙකුට රු. 52ක් ද වශයෙන් ගෙවිය යුතු අතර අක්කරයකට පොලව සැකසීමට රු. 4000ක් පමණ ද තෙල් පොහොර සඳහා රු. 3000ක් 4000ත් අතර ද මෙම සියල්ල ඇතුළුව සම්පූර්ණ අස්වනු ලබා ගන්නා තෙක් අක්කරයකට යන මුළු පිරිවැය රු. 12000ක් පමණ වන බවද බටු වගාවේ නියුතු ප්‍රධාන වැව්ලිකරුවන්ගේ තොරතුරු අනුව හෙළි විය. මේ පිරිවැය හැර අක්කරයක බටු වගා කිරීමෙන් ශුද්ධ වශයෙන් රු. 20000/-ක පමණ ලාභයක් ලබා ගත හැකි බවද ගොවීන්ගේ අදහස වෙයි. මේ හේතු මත රාජාංගන ප්‍රදේශයේ ගොවීන් විශාල පිරිසක් මේ වන විටත් මිරිස් වගාව පවා අතහැර බටු වගාවට යොමු වී ඇත.

බටු වගාව සඳහා අවශ්‍ය ඉඩම් වගාකරුවන් විසින් එම ප්‍රදේශයේ අතිරික්ත ඉඩම් හිමියන් ගෙන් හා වගා කටයුතු කිරීමට අපහසු පුද්ගලයින් ගෙන් අක්කරයක් සඳහා වසරකට රු. 500/- බැගින් දී ලබා ගනී. වගාව සඳහා බීජ මුල් අවධියේ දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් අතර වර්තමානයේ ගොවීන් බොහොමයක් බීජ තම තමන් විසින්ම සකස් කර ගනු ලබයි. මෙම ප්‍රදේශයේ බටු වගාව ආරම්භක අවධියේ ඒ සම්බන්ධයෙන් වැඩි අවබෝධයක් ගොවීන්ට තිබුනේ නැත. එහෙත් කාලයත් සමග ගොවීන් තම අත්දැකීම්

පදනම් කර ගෙන වගා කටයුතු කෙරේ මනා පළපුරුද්දක් ඇති කර ගන්නා ලදී. අලෙවිකරණ කටයුතු, මිල ආදිය ද මුල් අවධියේ එතරම් සංවිධානාත්මක ස්වරූපයකින් නොතිබූ අතර වගාවේ දියුණු වීමත් සමග මෙම අංශය දියුණු තත්ත්වයකට පත් විය. මේ දිනවල ප්‍රදේශයේ බටු කිලෝ එකක් රු. 2ත් 5 ත් අතර මිලකට අලෙවි වන අතර නිති පතා කොළඹ නුවර, අවිස්සාවේල්ල, මාවනැල්ල යන ප්‍රදේශ වලින් සතියේ අඟහරුවාද සිකුරාද යන දින වල ලොරි පැමිණ බටු තොග මිලදී ගනී.

දිස්ත්‍රික්කයේම බටු වගාව සඳහා 1986 වර්ෂයේ යෙදවීමට නියමිතව තිබූ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 815 ක් වන අතර මෙය දිස්ත්‍රික්කයේ එළවළු වවන බිම් ප්‍රමාණයෙන් 11% කි. ගොවීන්ගේ අත්දැකීම් අනුව බටුවල වර්ග අනුව අස්වනු ප්‍රමාණයේ සහ මිලේ වෙනසක් පවතී. ඉරි සහිත ලොකු බටු වලට වැඩි මිලක් මෙන්ම වැඩි ඉල්ලුමක් ද ඇති අතර එහි අස්වනු ප්‍රමාණය තරමක් අඩු බව කියයි. නිල් පාටට හුරු කුඩා ප්‍රමාණයේ බටු වලට තරමක් අඩු මිලක් ලැබුනත් වැඩි අස්වැන්නක් ලැබෙයැයි ගොවිහු කියති. විවිධ ප්‍රදේශ වලින් මේ

**බටු තොග මිල ගණන් — 1986 (කි. 1 කට)**

| | | | | |
|---|---|---|---|---|
| කොළඹ | 6.57 | 6.56 | 3.93 | 3.61 |
| නුවර | 5.76 | 5.15 | 3.83 | 2.41 |
| කුරුණෑගල | 6.28 | 4.48 | 2.53 | 3.25 |

මූලය : අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශය, ගො. ප, පු. ආ.

දිවයිනේ ප්‍රධාන තොග වෙළඳපලවල් තුනක තොග මිල ගණන් ඉහත සඳහන් ආකාරයට ඉහල මට්ටමක පැවතුනත් නිෂ්පාදකයාට ලැබෙනුයේ ඉතාමත් අඩු මිලකි. තත්ත්වය මෙසේ වෙතත් අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේ මිල දී ගැනීම් අංශයෙන් ද බටු තොග මිලදී ගනු ලබයි. එහිදී ගොවීන්ට සාධාරණ මිලක් ලැබෙයි. මේ ප්‍රදේශයේ බටු අලෙවියේ ද අනෙකුත් ගොවි ද්‍රව්‍ය වලට මෙන්ම ප්‍රාදේශීය රැස්කරන්නන් ද සිටියි. සතියකට වරක් අස්වනු ලබා ගත හැකි අතර අක්. 1 කින් සතියට බටු කිලෝ 800 ත් 1000 ත් අතර ප්‍රමාණයක් ලබා ගත හැකි බව ගොවීන්ගේ අදහසයි. බුෂිටා හා බණ්ඩක්කා අස්වනු ලැබීමේ දී දින 3 කට වරක් අස්වනු නෙලා ගත හැකිය. බුෂිටා හා බණ්ඩක්කා ඉක්මණින් අස්වනු ලැබීම අවසන් වන අතර වම්බටු වලින් නොකඩවා වසරක් එක හමාරක් විතර අස්වනු ලබා ගත හැකි වෙයි. දැනට මෙම ප්‍රදේශයේ අක්කර 300 ක පමණ ප්‍රධාන වශයෙන් බටු වගාව සඳහා යොදවා ඇත. දිස්ත්‍රික්ක යක් වශයෙන් ගත් කල අනුරාධපුරය

බටු වර්ග දෙකටම හොඳ ඉල්ලුමක් පවතින බව කිව හැකිය. කොලපාට ඉරි සහිත ලොකු බටු වලට කොළඹින් පැමිණෙන ලොරි වලින් හොඳ ඉල්ලුමක් පවතින බවත්, නිල්පාට කුඩා බටු වලට නුවරින් හොඳ ඉල්ලුමක් පවතින බවත් පෙනේ.

මූලික වශයෙන් ගොවීන්ට වගා කට යුතු වලදී තම වගාවන් ක්‍රමවත්ව හා සාර්ථක අන්දමින් කිරීමට උපදේශක සේවාවන් ලබා දිය යුතු වුවත් බටු වගාවේ නියැලි ගොවීන්ට ලැබෙන ව්‍යාප්ති සේවාවන් කිසි සේත්ම ප්‍රමාණවත් නොවන බව කිව හැකිය. මෙහිදී වගා කටයුතු සම්පූර්ණයෙන් ම සිදු කරන්නේ ගොවීන්ගේ සිතු මනාපය පරිදි වන අතර කිසිවෙකුගේ මග පෙන්වීමක් අනුව නොයන බව පැවසේ.

වගාව සඳහා පොහොර හා කෘමි නාශක යෙදීම සම්බන්ධයෙන් ද පැහැදිලි ක්‍රමවත් බවක් දැකිය නොහැකි අතර ගොවීන්ගේ හැඟීම් අනුව මේවා යෙදීම කරනු ලබයි. සත්‍ය වශයෙන්ම කෘමි හානි හෝ වෙනත් කිසි හානියක් නැතත් ගොවීන් පුරුද්දට අනුව දින 15 න් 15 ට කෘමි නාශක යොදවති. සමහර ගොවීන් අස්වනු නෙලීම ආසන්න අවධියේ දී පවා කෘමි නාශක යෙදීම කරනු ලබයි. මේ තත්ත්වය පාරිභෝගිකයාගේ පැත්තෙන් ඉතාමත් හානිකරවුවද ඒ ගැන ගොවීන් සැලකිලිමත් වීමක් නැත.

එමෙන් ම ගොවි ජනපදයේ ගොවීන්ට අවශ්‍ය පොහොර රසායනික ද්‍රව්‍ය ආදිය ලබා ගැනීම සඳහා ණය මුදල් ලබා ගැනීම අවශ්‍ය වුවත් ඔවුන්ට ආයතනික මාර්ග වලින් ලබා ණය ගැනීමඅපහසු

**දිස්ත්‍රික් අනුව සිල්ලර මිළ ගණන් — 1986 (කි. 1 කට)**

| | ජන. | පෙබ. | මාර්තු | අප්‍රේල් |
|---|---|---|---|---|
| කොළඹ | 10.36 | 11.30 | 8.56 | 8.80 |
| නුවර | 8.55 | 8.32 | 5.50 | 5.20 |
| අනුරාධපුරය | 6.00 | 6.99 | 4.85 | 5.40 |
| කුරුණෑගල | 7.65 | 6.12 | 4.95 | 6.68 |
| බදුල්ල | 7.10 | 8.44 | 5.44 | 5.33 |
| මොනරාගල | 4.43 | 5.48 | 4.77 | 5.59 |

මූලය : අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශය, ගො.ප.පු.ආ.

බටු වගාවේ නියැලි රාජාංගන ගොවි ජනපදයේ ගොවීන් ගේ වර්තමාන තත්වය යහපත් යැයි පෙනී ගියත් විවිධ හේතු මත එම ගොවි ජනතාව ආර්ථිකමය වශයෙන් විවිධ දුෂ්කර තාවලින් පෙලෙන බව කිව හැකිය. ගොවීන්ටමුහුණ දීමට සිදු වී ඇති දුෂ්කරතා හමුවේ ගොවීන් අසරණ තත්වයකට පත්ව සිටින බව කිව හැකිය

වී ඇත. එයට හේතුව නීතිමය වශයෙන් ඉඩම් අයිතීන් ප්‍රකාශ කිරීමට ඔප්පු ආදිය නොතිබීමයි. මේ හේතුව නිසා ගොවීන්ට පෞද්ගලික අංශයේ පිහිට පැතීමට සිදුවී ඇත. ගොවීන් මෙම පෞද්ගලික අංශයෙන් 20% ක් වැනි පොළියකට ණය ලබා ගෙන අධික ලෙස ණය බරින් පෙලෙන තත්ත්වයක් දැකිය හැකිය.

ගොවීන් විසින් නිෂ්පාදනය කරනු ලබන බටු තොග අලෙවි කර ගත හැකි වුවත් මෙහි දී ඔවුන්ට මුහුණ දීමට සිදුවන ගැටළු රැසකි. එනම් බටු අස්වනු නෙලන සමයේ තොග රැගෙන යාමට පිට ප්‍රදේශ වලින් ලොරි පැමිණියත් බොහෝ විට ඔවුන් අත්පිට මුදලට තොග ලබා ගැනීමක් නැත. ඔවුන් තොග රැගෙන යනුයේ මුදල් ගෙවීමේ පොරොන්දුව පිටය. මෙසේ තොග රැගෙන යන වෙළඳුන් සමහර විට ඔවුන් ගේ වෙළඳ පලවල එවකට මිල පහළ මට්ටමක පැවතුන බව පවසා පොරොන්දු වූ මිලට වඩා අඩු මුදලක් ගෙවූ අවස්ථා අනන්තය. සමහර වෙළඳුන් ගොවීන් ගෙන් බටු කිලෝ 1 රු. 2.50 ක් 3.00 ත් අතර මිළකට ගෙන ගොස් මුදල් ගෙවීමේ දී රු. 1.50 ත් 2.00 ත් අතර මිළකට මුදල් ගෙවා ඇත. තවත් සමහර පුද්ගල යන් මුදල් නොගෙවාම පැහැර හැරූ අවස්ථා ද ඇත. මෙය ගොවීන්ට මහත් දුෂ්කරතාවයකි. එමෙන් ම තම තොග විකුණා මුදල් ලබා ගැනීමට ඔවුන්ට සතියක් පමණ බලා සිටීමට සිදුවෙයි. මෙහිදී අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ද වරින් වර තොග ලබාගෙන ඇතත් එහි පැවති යම් යම් අකාර්යක්ෂමතා නිසා ගොවීහු තම නිෂ්පාදන දීමට අකමැත්තක් දක්වති. අලෙවි දෙපාර්තමේන්තුව පෞද්ගලික ගැණුම් කරුවන්ට වඩා ඉහල මිලක් ගෙවනු ලැබුවත් ලබා ගන්නා බටුවල ප්‍රමිතීන් ගොවීන්ට අවාසි දයක වී ඇත. එනම් ඉතාමත් හොඳ තත්ත්වයේ ප්‍රමාණයෙන් ලොකු බටු පමණක් දෙපාර්තමේන්තුවට ගනු ලබන අතර කුඩා ප්‍රමාණයේ බටු ඉතාම අඩු මිලකට පෞද්ගලික වෙළෙන්දට නැවත විකිනීමට සිදුවෙයි. එවැනි අවස්ථාවල පෞද්ගලික වෙළෙන්දන්ද එම තොග මිලදී ගැනීමට පවා අකමැති වෙයි. හේතුව හොඳ තත්ත්වයේ තොග දෙපාර්තමේන්තුවට අලෙවි කළ බව දැන ගැනීමයි. එමෙන්ම අස්වනු අධික වශයෙන් ලැබෙන අවධි වලදී විශාල වශයෙන් ප්‍රදේශයේ බටු තොග පවතින හෙයින් පෞද්ගලික වෙළඳුන් ඉතා අඩු මිලට පවා ගැනීමට පෙළඹෙන අවස්ථා ඇත. එවෙනි අවස්ථා වල ගොවීන් බටු අස්වැන්න නෙලා නොගෙන අත් හැරි අවස්ථා ද නැත්තේ නොවේ.

මෙවන් දහසකුත් එකක් බාධක මධ්‍යයේ වුවද බටු වගාවේ නියැලි, ගොවියා ඒ කෙරේ ම දිගින් දිගට ම නියැලි සිටීම දකිය හැක්කේ බටු වගාවෙන් ලැබිය හැකි සිත් ඇද ගන්නා සුළු ආදයම් තත්ත්වය නිසාය. මේ නිසා රජයේ ප්‍රතිපත්ති සම්පාදකයක් විසින් මේ පිළිබඳ තරමක් දුරට හෝ අවධානය යොමු කර ඒ සඳහා සුදුසු ව්‍යාප්ති සේවා වන් සහ අලෙවි කරන පහසුකම් සැප යීමට කටයුතු කරන්නේ නම් බටු වගාවේ නියුතු එවන් ගොවීන් ගේ ජීවන තත්ත්වය නගා සිටුවිය හැකි වෙයි.

එමෙන් ම මෙම වම්බටු වගාව දියුණු කිරීම සඳහා විශේෂ අවධානය යොමු කිරීමට තවත් වැදගත් හේතුවක් නම්, එලවළු අතරින් වැඩිම පරිභෝජනයක් වාර්තාකර ඇත්තේ වම්බටු වීමයි. මෙය පහත සඳහන් වගුවෙන් පැහැදිළි වෙයි.

**ඒක පුද්ගල එලවළු පරිභෝජනය (මාසික)**

| වර්ගය | ප්‍රමාණය (ග්‍රෑම්) |
|---|---|
| වම්බටු | 296 |
| මැකරල් | 156.6 |
| පතෝල | 78.1 |
| බෝංචි | 234.2 |
| ගෝවා | 192.7 |
| ලීක්ස් | 64.8 |

මූලය: සමාජ හා ආර්ථික පර්යේෂණ වාර්තාව — මහබැංකුව 1981/82.

මේ අනුව වසරකට බටු මෙ.ටො. 56520 ක් පමණ අවශ්‍ය වෙයි. මෙම අවශ්‍යතාවයෙන් 25%ක් පමණ අනුරාධපුරය දිස්ත්‍රික්කයේ නිපදවනු ලබයි.

එමෙන් ම ලංකාවේ හැම දිස්ත්‍රික්කයකම වැවෙන එලවළු වර්ගයක් වන බටු එලවළු වගාවට යොද ඇති මුළු බිම් ප්‍රමාණයෙන් වැඩිම ප්‍රමාණයක වගා කරනු ලබයි. එනම් එලවළු වවන මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර් 67991ක් වන අතර එයින් 6819 ක් හෙවත් 10%ක් බටු වගාව සඳහා යොදවා ඇත (1985/86 වගා ඉලක්කය). දිස්ත්‍රික් අනුව බලන කල වව්නියාව, කිලිනොච්චි දිස්ත්‍රික්ක වල වැඩිම එලවළු වවන බිම් ප්‍රමාණය වම්බටු වලට යොදවා ඇත. අනුරාධපුරය දිස්ත්‍රික්කයේ එලවළු වවන බිමින් 11% ක පමණ වම්බටු වවා ඇත.

එමෙන් ම වම්බටු වල මිල ගණන් ඉහළ යාම සම්බන්ධව ද සැලකිලිමත් විය යුතුයි. 1985 ට සාපේක්ෂව 1986 බටු මිළ ගණන් ශීඝ්‍ර ලෙස ඉහල ගොස් ඇති බව පෙනෙයි. මෙයට ප්‍රධාන හේතුව යාපනය වව්නියා කිලිනොච්චි වැනි ප්‍රදේශ වලින් වෙළඳ පලට එවන බටු තොග අඩුවීමයි. එම ප්‍රදේශවල පවතින අර්බුදකාරී තත්ත්වය මෙයට බලපා ඇත.

**පිට කොටුව සිල්ලර වෙළඳපලේ බටු මිල (කි/රු.)**

| | ජන. | පෙබ. | මාර්තු | අප්‍රේල් |
|---|---|---|---|---|
| 1985 | 6.66 | 5.97 | 5.76 | 6.64 |
| 1986 | 10.36 | 11.30 | 5.56 | 8.80 |

මූලය : අලෙවි හා ආහාරප්‍රතිපත්ති අංශය/ගො. ප. පු. ආ.

මෙම සටහනට අනුව මිළ ගණන් වල ඉහළ යාම මනාව පැහැදිළි වෙයි. මෙම තත්ත්වයන් මත ලංකාවේ බටු නිෂ්පාදනය දියුණු කිරීම සඳහා රාජාංගනය වැනි ප්‍රදේශ වලට ප්‍රමුඛත්වයක් දිය යුතු අතර මේ සඳහා පහත සඳහන් ක්‍රියා මාර්ග යෝග්‍ය යැයි නිර්දේශ කළ හැකිය.

1. ඒ ඒ ප්‍රදේශවල බටු වගාවේ නියුක්ත ගොවීන් වෙනුවෙන් මෙතෙක් ලබා දී නොමැති කෘෂි කාර්මික ව්‍යාප්ති සේවාවන් සොයා බලා ඒවා පුළුල් කිරීමට කටයුතු කල යුතුයි. මෙහිදී නව වගා ක්‍රම, ක්‍රමවත් පොහොර යෙදීම, කෘමි නාශක යෙදවීම් පිළිබඳ අවබෝධය ආදිය ක්‍රමවත් ව ලබා දිය යුතුයි.

2. බටු බීජ, පොහොර අවශ්‍ය රසායනික ද්‍රව්‍ය වලට කලට වේලාවට ගොවීන්ට ලබා ගත හැකි වන සේ සම්පාදනය කළ යුතුයි.

3. වගා කටයුතු සඳහා සහනදයක පොලී සහ කොන්දේසි මත වගා කට යුතු සඳහා ප්‍රමාණවත් ණය පහසුකම් ලබා දිය යුතුයි.

4. තොග අලෙවි කිරීමේ ක්‍රියාවලියේ දී පෞද්ගලික අංශය සමග තරඟකාරීව රාජ්‍ය අංශයේ ආයතන අස්වනු නෙලන කාලයට මිලදී ගැනීමේ කටයුතු වල යෙදිය යුතුයි.

5. බටු සඳහා පවතින දේශීය වෙළඳ පලට අමතර ව විදේශ වෙළඳ පල කෙරේ ද අවධානය යොමු කළ යුතුයි.

6. රාජාංගන ප්‍රදේශයේ මෙම බටු වගා ව්‍යාපෘතිය ආදර්යට ගෙන දිවයිනේ එවැනි තවත් ප්‍රදේශ වල මෙම වගාව සාර්ථකව කිරීම සම්බන්ධව අත්හද බැලීම් කල යුතු අතරම ඒ ඒ ප්‍රදේශවල ගොවීන් ට මෙයින් ලැබිය හැකි සාර්ථක ප්‍රතිලාභ පිළිබඳ අවබෝධයක් ලබා දිය යුතුය.